## චතාරික සමයේ දෙවන ඉරුදින

**තේමාව** : 'නූතන සමාජය තුල විශ්වාසයේ දිවියකින් සාක්ෂි දැරීමට සමිඳාණෝ අපව කැඳවන සේක¶

**හැඳින්වීම**

අපගේ උදාර ආදර්ශකයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ දුක් විඳින සේවකයෙකු ලෙස තමන්ට පැවරුණු ගැලවීමේ සැලැස්ම තම දුක්විඳීම හා ජීවිත පූජාව තුලින් සම්පූර්ණ කල සේක. ප්‍රසාද ස්නාපනය තුල ගැලවීමේ සැලැස්මද, පංගුකාරයන් වන්නට කැඳවා ඇති අපගේ ජීවිත සාක්ෂිය කෙසේ විය යුතුදැයි අපි මෙනෙහි කරමු. සියලු අභියෝගයන් ඉදිරියේ විශ්වාසයේ නව දැක්ම තුල ක්‍රියාකාරී වන්නට අවැසි ශක්තිය මෙම දිව්‍ය යාගය තුල අපි ලබා ගනිමු.

**ඇතුලුවීමේ ගීය** : කි. ගී. අංක 16- දෙවිඳුනි එමි මම පුදසුනටා

**පළමු කියවීම** : උත්පත්ති 12 : 1-4

දෙවියන් වහන්සේගේ හඬට සවන් දී එය දැඩි ලෙස විශ්වාස කරමින්, තම උපන් බිමද, නෑදැයින් හා පියාගේ උරුමයද අත්හැර නොදන්නා දේශයකට යන ආබ්‍රහම් විශ්වාසීය දිවියේ මහගු ආදර්ශය ලෙස උත්පත්ති පොත එතුමන්ව මෙසේ හඳුන්වා දෙයි.

**මෙනෙහි කිරීමේ ගීය** : දේව වාක්‍ය සංග්‍රහයේ එදිනට නියමිත පිළිතුරු ගීය ගායනා කරන්න.

**දෙවන කියවීම** : 2 තිමෝති 1 : 8-10

ක්‍රිස්තුන් වහන්සේ උදෙසා සාක්ෂි දැරීමට අප කැඳවන සමිඳාණෝම එම කාර්යය සඳහා අප ආලෝකමත් කර ශක්තිමත් කරන බව පාවුළුතුමා තිමෝතියස්ට යැවූ දෙවන ලිපියේ මෙම පාඨය තුලින් පැහැදිලි කරයි.

**සාධුකාරය** :

**ශු. සුවිශේෂය**: මතෙව් 17 : 1-9

**විශ්වාසකයින්ගේ යැදුම්**

**පිළිතුර** : ස්වාමිනී අපි ඔබවහන්සේට යාච්ඤා කරමු.

1. ආදර දෙවිපියාණනී, දේව විශ්වාසයේ අත් දකිමින් සමිඳුන් තුල නිරන්තයෙන් යැපෙන දිවි මඟට ජනතාව යොමු කරවන්නටද, අප සාන්ත සභා නායකයින් හට මඟ පෙන්වීම ලැබෙන පිණිස ,

2. අදර දෙවිපියාණනී, අප දේශයේ දිනෙන් දින උග්‍රවන අසමගිය, දිළිඳුකම නිමකර, සාමය සහෝදරත්වය ගොඩනැගීම සඳහා නැගෙන සමිඳු හඬට සන්වේදී වීමට අප රටේ නායකයින්ගේ හදවත් පුබුදුවාලන පිණිස,

3. ආදර දෙවිපියාණනී, ප්‍රසාද ස්නාපනය තුල ක්‍රිස්තු අනුගාමකයින් වන්නට කැඳවීම ලබා ඇති අප සැම අපගේ ජීවිත තුල සියලු අභියෝගයන් ඉදිරියේ විශ්වාසවන්තව සිටීමට අවැසි වරම් ලබාගනු පිණිස,

4. ආදර දෙවිපියාණනී, මෙම චතාරික සමයේ අප සහභාගී වන ජනවන්දනා වත් පිළිවෙත් මඟින් සැබෑ ජීවිත වෙනසක් ඇති කර ගැනීමට අප සැම උනන්දු වන පිණිස,

**පඬුරු පිදීමේ ගීය** : කි.ගී. අංක 111- සියලු බලැති

**බොජුන් ගීය** : කි.ගී. අංක 201- සමිඳේ මම සූදානම්

**අවසාන ගීය** : කි.ගී. අංක 261- සාමයේ මිහිර බෙදා

# චතාරික සමයේ දෙවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය — උත්පත්ති 12: 1–4

*උත්පත්ති පොතෙන් උපටා ගත් කොටසකි.*

දේව ජනතාවගේ ආදි පිතෘ වන ආබ්‍රහම්ගේ කැඳවීම.

සමිඳාණන් වහන්සේ ආබ්‍රම්ට කතා කොට, “නුඹේ මවු බිම ද නුඹේ නෑදෑයන් ද නුඹේ පියාගේ ගෘහය ද අත්හැරදමා, මා පෙන්වන්නට යන දේශයට යන්න. මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි: මම නුඹට ආශිර්වාද කරන්නෙමි: නුඹේ නාමය ආසිරි පැතීමේ නාමයක් වන සේ කීර්තියට පමුණුවන්නෙමි. නුඹට ආසිරි පතන අයට මමත් ආසිරි පතමි. නුඹට දෙස් තබන අයට මමත් දෙස් තබමි. නුඹ මගෙන් ආසිරි ලත් අයුරින් මිහි මත සව් සත ආසිරි ලබනු ඇතැ”යි වදාළ සේක. ආබ්‍රම්ට වයස අවුරුදු හැත්තෑපහක් වූ කල සමිඳාණන් වහන්සේ ඔහුට වදාළ ලෙසට, ඔහු හාරාන් දේශයෙන් පිටත් විය. ලොත් ද ඔහු සමග ගියේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 33: 4–5, 18–20, 22

පිළිතුර : සමිඳුනි, ඔබ අපගේ බලාපොරොත්තුව හා කරුණාව වේවා!

ගීය : සමිඳුන්ගේ වචනය අවංක ය:
එතුමන්ගේ ක්‍රියා සියල්ලක් ම විශ්වාසශීලී ය.
දැහැමි බව හා යුක්තිය එතුමන්ට ප්‍රිය ය.
මහ පොළොව හිමි තුමන්ගේ කරුණාවෙන් පිරී ඇත.

සමිඳුන්ගේ නෙත් දේව ගරු බිය ඇත්තන් කෙරෙහි ය:
මරණයෙන් ගළවන පිණිස ද
දුබික් දුරු කොට දිවි රක්නා පිණිස ද
එතුමාණෝ දිවැසින් බලන සේක.

අපි හිමි තුමන් කෙරේ විශ්වාසයෙන් බලා සිටියෙමු.
අපේ පිහිටත්, පලිහත් එතුමාණෝ ය.
සමිඳුනි, ඔබ කෙරේ අපේ බලාපොරොත්තු පිහිටෙවු ලෙස ම
ඔබේ කරුණාව අප කෙරෙහි වේ වා!

## දෙවන දේව ප්‍රකාශනය 2 තිමෝති 1: 8–10

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තිමොතියස්ට ලියන ලද දෙවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

### අප ගළවා ගත් සමිඳාණෝ කැපවූ ජීවිතයකට අප කැඳවූ සේක.

එහෙයින් අපේ සමිඳාණන් වහන්සේ උදෙසා සාක්ෂි දැරීම ගැනත්, උන් වහන්සේගේ සිරකරුවා වන මා ගැනත්, ලජ්ජා නොවන්න. එහෙත් දෙවියන් වහන්සේගේ බලය කෙරෙහි විශ්වාසය තබා, සුබ අස්න වෙනුවෙන් දුක් විඳීමෙහි පංගුකාරයෙක් වන්න. උන් වහන්සේ අප ගළවා, කැපවූ ජීවිතයකට අප කැඳවූ සේක. එසේ කළේ අපේ ම පුණ්‍ය ක්‍රියාවක් නිසා නොව, උන් වහන්සේගේ ම අභිප්‍රායත් දේව වරප්‍රසාදයත් අනුව ය. මෙය, කාලයාගේ පටන්ගැන්මට පෙර ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ විසින් දෙනලද්දකි. එහෙත් මෙය දැන් එළිදරව් කරන ලද්දේ අපේ මිදුම්කාරයාණන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ප්‍රකාශ වීමෙන් ය. උන් වහන්සේ මරණයේ බලය බිඳදමා, ජීවනයත්, අමරණීය භාවයත්, සුබ අස්න මගින් හෙළි කර වදාළ සේක.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද මතෙව් 17: 5

දීප්තිමත් වළාකුළකින් පියාණන්ගේ හඬ ශබ්දය නික්මුණේ ය.
"මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔහුට සවන් දෙන්න."

## සුවිශේෂය මතෙව් 17: 1-9

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### ජේසුස් වහන්සේගේ මුහුණ හිරු මඬල මෙන් බැබළිණි.

සදවසකට පසු ජේසුස් වහන්සේ පේදුරු ද ජාකොබ් ද ඔහුගේ සහෝදර ජොහන් ද කැඳවාගෙන, වෙන් ව උස් කන්දකට වැඩිය සේක. උන් වහන්සේ ඔවුන් අබිමුවෙහි අන්වෙසක් වූ සේක. උන් වහන්සේගේ මුහුණ හිරු මෙන් බැබළිණි; වස්ත්‍ර ද ආලෝකය මෙන් සුදු විය. එකෙණෙහි ම මෝසෙස් ද එළියා ද උන් වහන්සේ සමඟ කතා කරමින් සිටිනු ඔවුන්ට පෙණිනි. පේදුරු ජේසුස් වහන්සේට කතා කොට, “ස්වාමිනි, අපට මෙහි සිටින්න ලැබීම වාසනාවකි; ඔබ කැමැති සේක් නම් මණ්ඩප තුනක්, එකක් ඔබට ද එකක් මෝසෙස්ට ද එකක් එළියාට ද සාදන්නෙමි”යි කී ය. ඔහු කතා කරද්දී දීප්තිමත් වලාකුළක් ඔවුන් සිසාරා පැතිරිණි. තවද, “මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය; මම මොහු කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි; මොහුට සවන් දෙන්නැ”යි කියන හඬක් නික්මිණි. ශ්‍රාවකයෝ ඒ අසා, අතිශයින් බියපත් වී මුහුණින් වැටුණාහ. ජේසුස් වහන්සේ අවුත්, ඔවුන්ට අත ගසා, “නැඟිටින්න, බිය නොවන්නැ”යි වදාළ සේක. ඇස් ඔසවා බැලූ කල ඔව්හු ජේසුස් වහන්සේ හැර වෙන කිසිවෙකු නුදුටුවෝ ය.

ඔවුන් කන්දෙන් බැස එද්දී ජේසුස් වහන්සේ කතා කරමින්, “මනුෂ්‍ය-පුත්‍රයාණන් මළවුන් කෙරෙන් නැඟිටින තුරු මේ දර්ශනය කිසිවෙකුට නොකියන්නැ”යි ඔවුන්ට අණ කළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*



## "ස්වාමිනී, අපට මෙහි සිටින්නට ලැබීමත් වාසනාවකි."

*චතාරික සමයේ දෙවන ඉරුදින - 12-03-2017*

### හැඳින්වීම

දෙවි කෙනෙක් නැතැයි කියා පෙන්වීමට ගොඩනැගූ තර්කානුකූල විග්‍රහයක් කියවන්නට හෝ අසන්නට ඔබට ලැබුණොත්, ඔබේ විශ්වාසයට කුමක් වෙයිද? ඔබත් ඊට තර්කානුකූල පිළිතුරක් සොයා ගැනීමට වෙහෙසෙන්නේ නැද්ද? ඇයි ඒ? ඒ අපේ මනුෂ්‍ය ස්වභාවයයි. බුද්ධි ගෝචර වන දේ කෙරෙහි වඩාත් සමීප වීමට අප කැමැත්තක් දක්වයි. එහෙත් බුද්ධියෙන් ලබන තේරුම් ගැනීමට වඩා ප්‍රබල සාක්ෂි දැරීමක් ඇත. එනම් අත්දැකීමයි. දෙවියන් වහන්සේගේ වැඩ සිටීම තව කෙනෙකුට තර්කානුකූලව ඔප්පු කර පෙන්වීමට ඔබට නොහැක. එහෙත් ඔබට උන්වහන්සේව අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කර ගැනීමට හැකියාව ඇත. මේ අත්දැකීම ලැබීමට සෑම කිතුනුවෙක් ම වෙහෙසිය යුතුය. එවිට මුලු ලෝකය ම විශ්වාසය අත්හැරියත් ඔබට එය ප්‍රශ්නයක් නොවනු ඇත.

### දේව වචනය

උත්පත්ති 12:1-4

ගීතාවලිය 33:4-5, 18-20, 22

2 තිමෝති 1:8-10

ශු. මතෙව් 17:1-9

චතාරික කාලයේ ඉරිදාවන් වල දී පළමු කියවීම යොදා ගැනෙන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළින් දෙවියන් වහන්සේ සිදුකළ ලෝකය ගළවාගැනීමේ ක්‍රියාවට ලෝකය සූදානම් කළ ආකාරයත්, පෙර නිමිති තුළින් ඒ පිළිබඳව දැනුම් දුන් ආකාරයත් අවධාරණය කිරීමටයි. අද පළමු කියවීමට ඇතුළත් වන ආබ්‍රහම් කැඳවීම ගැළවීමේ ඉතිහාසයේ සන්ධිස්ථානයකි. අද මෙන් නොව සෑම උවමනාවකට ම පාහේ මිනිසා තමන්ගේ නෑ හිතවතුන් මත යැපුණු ආදි කාලයක දී ගම් බිම් හැර දමා යාම සුළු පටු තීරණයක් නොවීය. ආබ්‍රහම් දෙවියන් වහන්සේ කෙරෙහි තැබූ විශ්වාසයේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු වන්නේ මේ නිසාය. ඔහුට දෙවියන් වහන්සේ කෙරෙහි තිබූ බලවත් අත්දැකීම ඒ සඳහා උදව් විය.



චතාරික කාලයේ දෙවන ඉරිදා සුවිශේෂයට සාම්ප්‍රදායිකව යොදා ගැනෙන්නේ ජේසුන් ක්‍රිස්තුන් වහන්සේගේ අන්‍යාරූප විලාශ වීමේ සිද්ධියයි. මෙම සිද්ධිය උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැනත් ඉන් අනතුරුව පැමිණෙන මහිමාන්විත උත්ථානය ගැනත් ඉඟි කරයි. තුන්වන වසරේ දී භාවිතා වන ලූක් තුමාගේ සුවිශේෂයේ මේ බව වඩාත් පැහැදිලිය. එහිදී එලියා සහා මෝසෙස් ජේසුන් වහන්සේ ජෙරුසලමේ දී කරන්නට යන ජීවිත පූජාව ගැන කතා කළ බව සඳහන් වේ. අන්‍යාරූප විලාශ වීම ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍ය ජීවිතයේ වැදගත් සිද්ධියකි. උන්වහන්සේ මනුෂ්‍යයෙක්ව සිටිමින් දේවත්වයේ මහිමය ප්‍රකාශ කළ එකම අවස්ථාව මෙය වේ.

ආබ්‍රහම්ව කැඳවීමේ තේමාවට සමාන තේමාවක් ගැන දෙවන කියවීමෙන් කතා කරන පාවුලු තුමා කිතුනුවෙකු වීමට අපට ලැබී ඇති කැඳවීම ගැන

සඳහන් කරයි. එතුමා මෙහිදී අවධාරණය කරන කාරණය නම් අපව කැඳවනු ලැබ ඇත්තේ අපගේ යහපත් ක්‍රියා නිසා නොව උන්වහන්සේගේ ම කැමැත්ත හේතුවෙන් බවයි.

## මෙනෙහි කිරීම

චතාරික සමයේ පළමු ඉරිදාවන් දෙකේ සුවිශේෂ පාඨ වලින් සෑම වසරකදී ම ඉදිරිපත් කරන්නේ එකම සිද්ධීන් දෙකකි. පසුගිය සතියේ සුවිශේෂය අපට ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍යාත්වය ඉස්මතු කර පෙන්වීය. උන්වහන්සේ පූර්ණ මනුෂ්‍යයෙකු ලෙස අප මෙන් පරීක්ෂා කරනු ලැබීය. මේ සතියේ සුවිශේෂය උන්වහන්සේගේ දේවත්වයේ මහිමය අවධාරණය කරයි. සභා මාතාව මෙවැනි තෝරාගැනීමක් කර ඇත්තේ ඇයි?



අප සෑම කෙනෙකුට ම ප්‍රශ්න තිබේ. ප්‍රශ්න නැති කාලයක් නැත. එහෙත් සමහර කාල වල දී සාමාන්‍ය තත්වයට වඩා දුෂ්කර තත්වයන්ට මුහුණ දීමට සිදුවේ. මෙය එක්තරා විදිහකින් පරීක්ෂාවකි. මන්ද **වේදනාවට මුහුණ දීමට අපට ක්‍රම දෙකක් තිබේ. එකක් නම් අපේ දුර්වල ස්වභාවයෙන් ඊට මුහුණ දීමයි. එනම් කෝපය, වෛරය, පළිගැනීම, කලකිරීම ආදියට යටත් වීමයි. මෙම ක්‍රමයේ දී සෑම විට ම අපේ වේදනාවට හේතුව වෙන කෙනෙකුගේ වරදක් ලෙස අපට පෙනෙයි.** අපේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා තව කෙනෙකුගේ වෙනස්වීමක් අපි බලාපොරොත්තු වෙමු. වැඩි දෙනෙක් ප්‍රශ්න වලට මුහුණ දෙන්නේ මේ ක්‍රමයෙනි. එහෙත් මෙය මුළුමනින් ම අසාර්ථක, නිරර්ථක ක්‍රමයකි.

**දෙවන ක්‍රමය නම් දේව ස්වභාවය තුළට ඇතුළු වෙමින් ප්‍රශ්නයට මුහුණ දීමයි. එනම් දෙවියන් වහන්සේගේ ආදරයට ඇතුළු වීමට වේදනාව මාර්ගයක් කර ගැනීමයි. මෙම ක්‍රමයේ දී අප හැරෙන්නේ අපේ ම ඇතුළාන්තයටයි.** අපේ ප්‍රශ්නය තව කෙනෙකුගේ වරදක ප්‍රතිපලයක් ලෙස නොදකිමු. සමාව දීමට, බැහැපත් වීමට, ඉවසීමට, අත්හැරීමට අපට බලය ලැබේ. මෙම ක්‍රමයෙන් ප්‍රශ්න වලට මුහුන දෙන අය යාච්ඤා ජීවිතයේ ගැඹුරින් ගැඹුරට ගමන් කරයි. මෙහි ප්‍රතිපලයක් ලෙස දෙවියන් වහන්සේ අපට යාච්ඤාව තුළ දී උන්වහන්සේගේ ආදරයත්, ජීවමාන වැඩ සිටීමත් ඉතා සමීපව දැනෙන්නට සලවස්වයි. බොහෝ විට මෙය ඉතා කෙටි අත්දැකීමකි. එහෙත් එය ඉතා ස්ථිර ය, පැහැදිලි ය. නිසැකව ම දෙවියන් වහන්සේ අපට කතා කළ බවක් අපට තහවුරු වේ. අලුතින් හිතන්නට, අලුතින් දකින්නට, වෙනස් ම තීරණයක් ගැනීමට අපට හැකියාව ලැබේ. මෙය අපේ තේරුම් ගැනීමට එපිටින් සිදුවන්නකි. ප්‍රශ්නය තවම විසඳී නැත. එහෙත් අප තුළ සාමයක් ඇත. තනිකමක් නැත.

අද සුවිශේෂයට මෙහි ඇති සම්බන්ධය කුමක්ද?

අන්‍යරූප විලාසවීමත් එවැනි මොහොතකි. දහසය වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ඒ ගැන මෙසේ විස්තර කර ඇත: "යම් කෙනෙකුට දෙවියන් වහන්සේ පිළිබඳ බලවත් අත්දැකීමක් ලැබීම, අන්‍යරූපවිලාස වූ මොහොතේ ගෝලයින් දුටු දෙයට සමාන ය. ඔවුහු කාලය පසුකර ගොස් ඉදිරියේ දී සිදුවන්නට නියමිත ස්වර්ගීය ප්‍රීතිය අත්දුටුවෝය. මේවා සමාන්‍යයෙන්, පීඩා සහිත කාල වකවානු පැමිණෙන්නට ආසන්න විට දෙවියන් වහන්සේ අපට දෙන කෙටි අත්දැකීම් වේ." මෙවැනි අත්දැකීමක් ලැබීම ඇත්තෙන් ම වරප්‍රසාදයකි.

අද පළමු කියවීමේ විස්තර වන ආකාරයට ආබ්‍රහම්ට ගම රට අත්හැර යන්නට ශක්තියක් ලැබෙන්නේ මෙවැනි වරප්‍රසාදයේ අත්දැකීමක් තුළිනි. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට කතා කරන විට ඔහුගේ වයස අවුරුදු හැත්තෑ පහකි. අතන මෙතන දුව පැන ඇවිදින වයසක් නොවෙයි මේ. පරිසණක, දුරකථන නොව අඩුම තරමින් තැපැල් සේවයක්වත් නොතිබුණු නොදියුණු යුගයක දී ගම්බිම්, නෑදැයින් හැර දමා යෑම සදාකාලික වෙන්වීමක් වැනිය. එහෙත් ආබ්‍රහම් එසේ කරයි. එසේ කිරීමට ඔහුව පොළඹවන්නේ කුමක්ද? එය නම් දෙවියන් වහන්සේ පිළිබඳව ලැබූ අත්දැකීමේ ස්ථිරත්වයයි. දෙවියන් වහන්සේ ඔහුට කතා කළ බව ඉතා පැහැදිලි කාරණාවක් විය.

තාබෝර් කන්දේ දී සිදුවන්නේත් මෙවැනි දෙයකි. ජේසුන් වහන්සේ ක්‍රම ක්‍රමයෙන් තමන් වහන්සේගේ දූත කාර්යයේ අවසාන අදියරට ළඟා වෙමින් සිටියි. උන්වහන්සේ අවසන් වතාවට ජෙරුසලමට ගමන් ගන්නා සේක. තමන් වහන්සේට මුහුණ දෙන්නට තිබෙන භයානක අත්දැකීම ගැන තිගැස්මක් ජේසුන් වහන්සේට නොතිබුණා විය නොහැක. එහෙයින් පියාණන් වහන්සේ වඩාත් ලෙන්ගතු එමෙන්ම ප්‍රබල අත්දැකීමකින් ජේසුන් වහන්සේව ශක්තිමත් කරන සේක. ලූක් තුමාගේ සුවිශේෂයේ මෙය වඩාත් පැහැදිලිය. මෝසෙස් සහ එලියා ක්‍රිස්තුන් වහන්සේ සමග උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැන කතා කරමින් සිටිය බව ලූක් තුමා පවසයි.



අනෙක් අතට ගෝලයින්ට ද එය අත්‍යාවශ්‍ය වූ අත්දැකීමක් විය. ඔවුහු වසර තුනක පමණ කාලයක් ජේසුන් වහන්සේ පසුපස යමින්, දේශනා කරමින්, පුදුම ක්‍රියා දකිමින් ජීවත් වූහ. නමුත් දැන් ඔවුන්ට ඉතා බියජනක සිදුවීම් මාලාවකට මුහුණ දීමට සිදුවී තිබේ. තවමත් ඔවුන්ට ඇත්තේ සෙලවෙන විශ්වාසයක් බව ජේසුන් වහන්සේ දන්නා සේක. එහෙයින් උන්වහන්සේ දේවත්වයේ මහිමයෙන් බිඳක් ඔවුන්ට දකින්නට සලවස්වන සේක. ඉදිරියේ දී මුහුණ දීමට ඇති දුෂ්කර කාලයේ දී එය ඔවුන්ට ශක්තියක් වනු ඇත.

අපටත් දෙවියන් වහන්සේ මෙවැනි අත්දැකීම් ලබන්නට ඉඩ සලසන සේක. එහෙත් ඒවා හඳුනාගත හැක්කේ විශ්වාසයේ ඇස් වලින් පමණකි. ක්‍රිස්තියානි ජීවිතය දුක් වේදනා වලින් තොර වූවක් නොවේ. ක්‍රිස්තුන් වහන්සේ අපට එහි ඉහළම ආදර්ශය පෙන්වන සේක. දෙවියන් වහන්සේ පුත්‍රයාණන් වහන්සේට කෙතරම් ආදරය කළත් දුක්ප්‍රාප්තිය සහ කුරුසියේ මරණය උන්වහන්සේගෙන් ඉවත් නොකළ සේක. එසේ කළේ වඩා විශාල යහපතක් ඒ තුළින් උදා කරනු පිණිසයි. **ප්‍රශ්න, කරදර වලින් මිදෙන්නට අප කරන යාච්ඤා කෙතරම් ද? එහෙත් දෙවියන් වහන්සේ සෑම විට ම අපව ඒවායින් මුදා නොගන්නා සේක. හේතුව? ඒවා තුළින් අපටත් අනිත් අයටත් වඩා විශාල යහපතක් උදා කිරීමට උන්වහන්සේ සැලසුම් කර ඇති නිසාය.** අපට ඒ බව පෙනෙන්නේ නැත. තේරෙන්නේත් නැත. විශ්වාසය අවශ්‍ය වන්නේ ඒ නිසාය.

විශ්වාසය නැති වූ විට අපි ඉහත කී පළමු ක්‍රමයෙන් ප්‍රශ්න වලට මුහුණ දෙන්නට පෙළඹෙන්නෙමු. එහෙත් අපේ බලාපොරොත්තුව විය යුත්තේ දෙවෙනි ක්‍රමයයි. **දෙවියන් වහන්සේ වේදනාව අපෙන් ඉවත් නොකරන සේක් නම්, ඒ වේදනාවට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය අනිවාර්යයෙන් ම දෙන සේක. අපි විශ්වාසය අත්නොහැර සිටින්නෙමු නම් උන්වහන්සේ තාබෝර් කන්දේ දී ගෝලයින්ට දුන් අත්දැකීම වැනි අත්දැකීමකින් අපව ද ශක්තිමත් කරන සේක.**

සභා ඉතිහාසය පුරා ජීවත් වූ දස දහස් ගණනක් වූ සාන්තුවරයින්ගේ ජීවිත තුළ ඔවුන් විඳි දුක් වේදනා අපව පුදුමයට පත් කරයි. අනිත් හැම කෙනෙක් ම හොඳින් හෝ නරකින් තමන්ගේ සතුටත්, තමන්ගේ පහසුවත් සොයා ගන්නට වෙහෙසෙන විට මේ සාන්තුවරයින්ට මෙතරම් වේදනා උසුලාගෙන සිටින්නට හැකියාව ලැබුණේ කෙසේද? එක පිට එක එන කරදර ගොන්නක් මැද දීත් 'තවදුරටත් දෙවියන් ගැන බලාපොරොත්තු තියාගෙන ඉඳලා වැඩක් නෑ, දෙවියන් වහන්සේ මට ආදරේ නෑ, දෙවි කෙනෙක් නෑ' වැනි තැනකට වැටෙන්නේ නැතුව සිටින්නට ඔවුන්ට පුළුවන් වුණේ කොහොමද? යහපත කරන එක කෙතරම් වේදනාකාරී වුණත් එය අත්නොහැරීමට තරම් බලගතු ලෙස ඔවුන්ව ඇද බැඳ තබාගත්තේ කුමක්ද? ඒ ඔවුන් ලබා තිබූ අන්‍යරූපවිලාස වීමේ අත්දැකීමයි.

මෙහිදී අප ඉතා තදින් සිතට ගත යුතු කාරණය නම්, මෙම අත්දැකීම සාන්තුවරයින් සඳහා පමණක් වෙන්කර ඇති තිළිණයක් නොවන බවයි. දෙවියන් වහන්සේ එය සෑම කෙනෙකුට ම දෙන්නට බලා සිටින සේක. සාන්තුවරයින්ගේ ඇති විශේෂත්වය නම් ඔවුන් අප මෙන් උඩඟු නොවී දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා උන්වහන්සේව සොයා යෑමයි. අවංක සිතින් දෙවියන් වහන්සේව සොයන කිසිවෙකුට උන්වහන්සේව හමු නොවී තිබෙන්නේ නැත.

එවන් ශ්‍රේෂ්ඨ සාන්තුවරයෙකුගේ වචන අද අපට දෙවන කියවීමෙන් අසන්නට ලැබේ. පාවුලු තුමාට දුක් විඳීම සතුටට කාරණාවකි. සුබ අස්න වෙනුවෙන් දුක් විඳින්නට ඉදිරිපත් වන ලෙස එතුමා අපට ද ආරාධනා කරයි. සුබ අස්න වෙනුවෙන් දුක් විඳීමට දේශනා කරන්නට යෑමට ම අවශ්‍ය නැත. අද දවස ගැන සිතන්න. සෑම ක්‍රියාවක දී ම, කෙතරම් කුඩා දෙයක දී වුවත්, නිවැරදි දේ පමණක් ම කිරීමට සිතට ගන්න. එය පහසු නැත. ඒ දුක විඳින්නට ඔබට හැකිද? ඇත්ත වශයෙන් ම එය අපට අපේ ශක්තියෙන් කළ නොහැක. එමනිසා තාබෝර් කන්දේ දී ගෝලයින් ලැබූ අත්දැකීම අපට ද ලබා දෙන ලෙස ඉල්ලා මේ සතිය පුරා දෙවියන් වහන්සේට මහත් ඕනෑකමින් යාච්ඤා කරමු. උන්වහන්සේ අපේ යාච්ඤාවට පිළිතුරු නොදී සිටින්නේ නැත.

*"සමිඳුනී, මගේ ජීවිතය තුළ ඔබවහන්සේගේ ජීවමාන වැඩ සිටීමත්, ආදරයත් අත්දකින්නට මම මහත් ආශාවකින් පසුවෙමි. මගේ නුසුදුසුකම නොසළකා, ඔබවහන්සේ මට දක්වන ආදරය නිසා මට දයාව දක්වා, බලවත් ලෙස ඔබවහන්සේව හමුවන්නට මට පිහිට වුව මැනව."*

*irudinasupuwatha@gmail.com*